# වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව

## යාපනය දිස්ත්‍රික්කය

---------------------

1 මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම් වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට වඩමාරච්චි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සභාවට පරිත්‍යාගය වශයෙන් ලැබී තිබූ වාහන 6 ක වටිනාකම තක්සේරුකර නොතිබූ අතර එහි අයිතියද පවරා ගෙන නොතිබුණි. එම මොටර් වාහන ගිණුම්ගත නොකිරීමෙන් වාහන සහ කරත්ත වටිනාකම් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ආ) සභා බලප්‍රදේශයේ සුසාන භූමිවල තිබෙන ගොඩනැගිලි වටිනාකම් තක්සේරු දෙපාර්තමෙන්තුව මගින් තක්සේරුකර ගිණුම්වලට ගෙනවිත් නොතිබී නිසා ගිණුම්වල ගොඩනැගිලිවල වටිනාකම් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.3 ලේඛන හා පොත්පත් නොපැවැත්වීම

----------------------------------------

සභාව විසින් ගෙවීම් ලේඛනය,චෙක්පත්, මුදල් ඇනවුම් ලේඛනය,වාහන ලොග් සටහන් පොත්,විගණන විමසුම් ලේඛනය,විවිධ ණයහිමි ලේඛනය යනාදි ලේඛන පවත්වා නොතිබුණි

1.3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| | (i) | පරිච්ඡේදය III රීති 32 | සභාව විසින් වරිපනම් බදු සම්බන්ධයෙන් තක්සේරු ලේඛනයක් පවත්වා නොතිබුනු අතර, වරිපනම් අයකිරීම් සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| | (ii) | පරිච්ඡේදය III රීති 33 | එක් එක් කාර්තු අවසානයේදි බදු තක්සේරු ලිපිකරු විසින් බදු පැහැර හරින අයගේ ලැයිස්තුවක් සභාපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | (iii) | පරිච්ඡේදය III රීති 66 | රු. 2,188,048 ක හිඟ ආදායම් අයකර ගැනීම සඳහා සභාවේ ලේකම් විසින් කටයුතු කර නොතිබුණි. |
| | (iv) | පරිච්ඡේදය V රීති 120 | නිසි දිනවල අත්තිකාරම් නොපියවීම් සම්බන්ධයෙන් ලේකම් විසින් කටයුතු නොකිරීම නිසා රු. 1,012,297 වටිනා අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පියවා නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
| --- | --- |
| (i) මුදල් රෙගුලාසි 381(3) | චෙක්පත්වල අත්සන් කිරීම සඳහා බලය ලබා දී තිබූ නිලධාරීන් විස්තර ඇප මුදල් ගෙවා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | අදාල මාසයේ ධාවන සටහන් ඊළඟ මාසයේ 15 වන දිනට ප්‍රථම විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 48,863,336 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 56,275,746 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 7,412,410 කින් පහත වැටීමක් පෙන්නුම් කෙරිණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය ශුද්ධ අතිරික්තය රු. 4,319,523 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු. 6,558 ක් විය. මෙය සමාලෝචිත වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රතිඵලය රු. 4,312,965 කින් වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

## 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 196,103,440 ක් වී තිබූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 180,432,230 ක් වී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනයේ රු. 15,671,210 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

## 2.4 ආදායම් පරිපාලනය

### 2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්‍යසාධනය

ලේකම් විසින් ඉදිරිපත් කර තිබූ පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2016

| ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 670 | 141 | 2,188 |
| බදු කුලී | 25,686 | 17,106 | |
| බලපත්‍ර ගාස්තු | 1,457 | 1,612 | |
| වෙනත් ආදායම් | 93,912 | 87,662 | 81,730 |
| එකතුව | 121,725 | 106,521 | 83,918 |

2.4.2 වරිපනම් බදු

--------------

සමාලෝචිත වර්ෂයේ හිඟ වරිපනම් බදු රු. 2,138,421 ක් අයකර ගෙන නොතිබුණි.

2.4.3 මුද්දර ගාස්තු

--------------

2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ලැබියයුතු රු. 97,559,923 ක මුද්දර ගාස්තු ලබාගෙන නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 නිෂ්ක්‍රිය වත්කම්

------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පික්කප් වාහනය 2008 වර්ෂයේ සිට නිෂ්ක්‍රියව ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) ක්‍රියාකාරි තත්ත්වයේ තිබෙන විදුලි උත්පාදන යන්ත්‍රය 2006 වර්ෂයේ සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 120 ක් වුවද, තත්‍ය සේවක සංඛ්‍යාව 109 කි ඒ අනුව සේවක පුරප්පාඩු 11 ක් තිබුණි.

(ආ) සභාවේ ක්‍රියාකාරකම් කායීක්ෂමතාවයෙන් පවත්වා ගෙන යාම සඳහා වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 04 ක් පැවැත්විය යුතුය. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

රු. මිලියන 3 ක් වටිනා මුදලෙයිකුලි පානීය ජල ව්‍යාපෘත්තියේ වැඩ සම්පූර්ණ කර තිබුණද, ජලය බෙදාහැරීමේ ක්‍රියාවලිය ආරම්භකර නොතිබුණි.

3.4 කසළ කළමනාකරණ

-----------------------

කසළ වර්ගීකරණය නොකර ගොඩකර තිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

අයවැය පාලනය

-----------------

වියදම් ව්‍යුහය

---------------

අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු. 128,152 සිට රු. 9,151,531 දක්වා වියදම් විචලනයක් විගණනයේදී නිරීක්ෂණය විය.